**හලාවත නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බැංකු ශේෂ සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම රු.778,803 ක් වුවත්, රු. 1,557,605 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් පොලී ආදායම රු.778,802 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල කඩ කුලී ආදායම රු.14,718,676 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශනවල එය රු.10,929,507 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල බදු කුලී ආදායම රු.8,370,948 ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශන වල එම අගය රු.4,067 684ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබියයුතු පළාත් නිශ්චිත ආධාර අරමුදල් යටතේ රු. 1,691,050 ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 18 කට අදාලව පාලන ගිණුම් අනුව වූ ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර රු. 65,403,264 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන රු. 8,871,877 ක පෙර ගෙවුම් වටිනාකම නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.70,070,708ක්වූ අතර එයින් 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අයත් රු.13,944,828 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයට පෙර සිට පලාත් පාලන කොමසාරිස්ගෙන් අයවිය යුතු රු.501,568 ක් වූ හිඟ විනෝද බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නගර සභාවේ වත්කම් 05 ක් 2014 පෙර වර්ෂවලදී බදු දීම වෙනුවෙන් අයවියයුතු රු.591,631 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.234,901,323 ක්වූ ගිණුම් විෂයයන් 08 කට අදාලව විස්තරාත්මක උපලේඛන,භාණ්ඩ සමීක්ෂණ වාර්තා, සාරාංශ වාර්තා සහ කාල විශ්ලේෂණ යනාදී සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තිරණ යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීතී,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවිම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ. 571 | තැන්පත් ශේෂයෙහි ඇතුලත් රු.10,233,348 ක් වු කල් ඉකුත් තැන්පත් ආදායමට ගැනිමට හෝ අවශ්‍ය ගැලපිම් කිරිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වු වියදම රු21,969,182 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 47,861,605 ක් විය.

.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,830,787 ක පිරිහීම සඳහා ආදායම් විෂයයන් හතරක් රු.28,219,223 කින් අඩුවීමත්, වියදම් විෂයයන් තුනක් රු.51,279,780 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**------------------------**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

**---------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට රැස්කලයුතු වරිපනම් බදු ආදායමෙන් සියයට 64 ක්, බදු කුලි ආදායමෙන් සියයට 27 ක් සහ කඩකුලි ආදායමෙන් සියයට 68 ක් රැස් කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.3.2 වරිපනම්**

**----------**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.31,878,914 ක්වූ වරිපනම් බදු හිඟය අදාල කාලවකවානු තුලදී රැස්කර ගැනීමේ වගකීම ඉටුකර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

**-----------**

සමාලෝචිත වර්ෂය අවසානයට බදු කුලිය රු.6,096,794 ක් හිඟව පැවති අතර, එය අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

**-----------------**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.22,898,519 ක් වූ හිඟ කඩ කුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

**--------------**

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.44,290,255 ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන 2013 පෙබරවාරි මස සිට කඩකුලී සංශෝධනයන් සම්බන්ධයෙන් ආදායම් ලේඛන පවත්වා තිබුණද, එකී සංශෝධිත කඩ කුලී අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.19,867,449 ක කඩ කුලී හිඟව පැවති අතර සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය තුළ කිසිදු කුලී මුදලක් නොගෙවු බදුකරුවන් 94 දෙනෙක් විය. එම එක්

එක් පුද්ගලයාගේ හිඟ කඩ කුලී මුදල රුපියල් ලක්ෂයේ සිට ලක්ෂ 09 දක්වා පරාසයක පැවති අතර, මෙම මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාපාර සඳහා බදු අය කිරීමේදී බල ප්‍රදේශයේ පවත්නා නව ව්‍යාපාර හඳුනාගෙන එම ව්‍යාපාරවලින් බිල් කරන ලද ආදායම එක්රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). නගර සභා බල ප්‍රදේශය තුල විවිධ කාර්යයන් සඳහා වූ දැන්වීම් පුවරු සහ ස්ථිර දැන්වීම් පුවරු වෙනුවෙන් ගාස්තු අය කිරීමට අදාල ගැසට් නිවේදන නිකුත් නොකිරීම හේතුවෙන් ඒ මත වූ ආදායම් නගර සභාවට අහිමි වී තිබුණි.

(ඉ). 2015 හා 2016 වර්ෂය තුල පිළිවෙලින් සැලසුම් 84 ක් හා 97 ක් අනුමත කර තිබූ නමුත් 2017 මැයි 04 දින වන විටත් අනුකූලතා සහතික ලබාගෙන තිබුණේ පිළිවෙලින් 03ක් හා 08ක් සඳහා පමණි. අනුකූලතා සහතික ලබා නොගත් ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එමෙන්ම අනුකූලතා සහතික නිකුත් කල ඉදිකිරීම් සඳහා තාවකාලික තක්සේරුවක් සිදුකර වරිපනම් බදු අයකිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඊ) හලාවත මාළු වෙළඳපල 2016 වර්ෂය සඳහා රු.7,100,100 ක මුදලකට බදු ගැනීමට ප්‍රසම්පාදන කටයුතු මගින් පුද්ගලයෙකු ඉදිරිපත් වී තිබූ නමුත්, 2017 අප්‍රේල් මස 11 දින වන විටත් ඔහු සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. එහෙත් එම බදුකරු මාළු වෙළඳපලෙහි ගාස්තු එකතු කිරීම සිදුකර තිබුණු අතර, සභාවට අයවිය යුතු රු.2,141,873ක් අයකර ගැනීමට සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**3.2 මතභේදයට තුඩු දුන් ගණුදෙනු**

---------------------------------

වරිපනම් හිඟ මුදල් අයකර ගැනීමේදී වරෙන්තු ගාස්තු ගණනය කර අය නොකර හිඟ වරිපනම් වාරිකය පමණක් අයකිරීමේ පිළිවෙතක් සභාව අනුගමනය කර තිබීම තුල සභාවට පාඩු සිදුවී තිබුණි.

**3.3 කසළ කළමනාකරණය**

----------------------

නගර සභා බල ප්‍රදේශය තුල දෛනිකව එකතු වන ටොන් 16 ක් පමණ වූ කැලි කසල විවෘත භූමියකට බැහැර කිරීම නිසා පාරිසරික ප්‍රශ්න සහ ගැටළු වර්ධනය වෙමින් පැවතුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව අනුව විධායක ශ්‍රේණියේ පුරප්පාඩුවක්, ද්වීතික ශ්‍රේණියේ පුරප්පාඩු 53 ක් හා ප්‍රාථමික ශ්‍රේණියේ අතිරික්ත 36 ක් විය.

**4. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**4.1 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------------

2014 පෙබරවාරි 17 දිනැති හා අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ඉඩම් හා ගොඩනැගිලිවල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | ණයගැතියෝ | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීමට හෝ ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) | ණයහිමියෝ | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට හෝ ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි |
| (ඈ) | ආදායම් | හිඟ ආදායම් අයකර ගැනීමට පනතේ විධිවිධාන අනුව කටයතු කර නොතිබුණි. |
| (ඉ) | අයවැය පිළියෙල කිරීම | අයවැය සීමාකාරී සාධකයක් වී නොතිබුණු අතර, අනවශ්‍ය පරිදි ප්‍රතිපාදන ඇති කර තිබුණි. |
| (ඊ) | ගිණුම් පිළියෙල කිරීම | ගිණුම් පිළියෙල කිරීම සඳහා වූ විස්තර අදාල අංශවලින් නියමිත පරිදි ඉදිරිපත් නොකිරීම. |